# COLONICAL TRANSFORMATION IN SRI LANKA (Part II)

# ආර්ථික හා සමාජ පරිවර්තන

යටත් විජිත රාජ්‍යය ලංකාවේ හඳුන්වා දුන් ප්‍රතිපත්තීන්ගේ බලපෑම දෙයාකාර වේ. එනම්

I. අපේක්ෂිත ප්‍රතිඵල
II. අනපේක්ෂිත ප්‍රතිඵල, මේවා සාධනීය වීමට හෝ නොවීමට හෝ ඉඩ ඇත.

ආර්ථික හා සමාජ පරිවර්තනය තල දෙකක් යටතේ සිදු විය.

I. යටත් විජිත ධනවාදයේ ආරම්භය සහ ව්‍යාප්තිය.
II. යටත් විජිත සමාජ පරිවර්තනය.

ආර්ථික තලයේ සිදු වූ වෙනස්කම්වල පදනම ලෙස ලංකාවේ යටත් විජිත ධනවාදී ආර්ථිකයක් සම්භව වීම පෙන්වා දිය හැකි ය. යටත් විජිත කාරක රාජ්‍ය යටත් විජිතය තමන් යටතට නතුකර ගැනීමෙන් බලාපොරොත්තු වන්නේ මවුරටේ කර්මාන්තයට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය හා පරිභෝජනය සඳහා අවශ්‍ය කරන ද්විතීයක කෘෂිකාර්මික ද්‍රව්‍ය සම්පාදකයකු ලෙස තබා ගැනීම හා මවු රාජ්‍යයේ කාර්මික ව්‍යවසායකයන් සඳහා වෙළෙඳපළක් ලෙස තබා ගැනීමයි.

ClassWork.LK

මේ ක්‍රියාවලිය සඳහා විවෘත ශ්‍රම වෙළෙඳපොළක් හා ඉඩම් වෙළඳපොලක් ඇති කිරීම සඳහා රාජකාරි ක්‍රමය අහෝසි කිරීමත් මුඩුබිම් හා කිරීටයේ ඉඩම් වැනි ආඥාපනත් හරහා පළමුව කෝපි දෙවනුව තේ, රබර්, පොල් වැනි වාණිජ බෝග සඳහා ඉඩම් වෙළෙඳපළක් රාජ්‍යයේ මැදිහත් වීමෙන් ඇති කිරීමත් පෙන්වා දිය හැකිය.

මේ අනුව ලංකාව ප්‍රාථමික කෘෂිකාර්මික ද්‍රව්‍ය නිෂ්පාදකයකු ලෙස ලෝක ධනවාදී ආර්ථික ක්‍රමය සමඟ සම්බන්ධ වේ. රජයේ අවධානය යොමු වන්නේ වාණිජ වතු වගාවන් සඳහා අවශ්‍ය කරන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම (උද්‍යාන, මහාමාර්ග, දුම්රිය) හා අදාළ විද්‍යාත්මක පර්යේෂණ කිරීම කෙරෙහි පමණි.

වෙළෙඳපොළෙහි විකිණීම සඳහා කෙරෙන මහා පරිමාණ වාණිජ කෘෂි ආර්ථිකයකින් සමන්විත වෙළෙඳපොළක් බිහි විය.

Class Work LK

යටත් විජිත ප්‍රතිපත්තිය මඟින් අරමුණු නොකළ සාධනීය ප්‍රතිඵල ද තිබේ. ඒවා නම් පළමුව අරක්කු රේන්දය මිලට ගත් හා පසු ව වතු කම්කරුවන්ට හා ව්‍යවසායකයන්ට අවශ්‍ය මූලික සේවාවන් සැපයූ (කරත්තකරුවන් ලෙස, කුඩා කඩහිමියන් ලෙස) යම් ප්‍රාග්ධන සමුච්චිතකරණයක් අත් කරගත් දේශීය ධනපති පන්තියක සම්භවය ය.

ඉහත කී සේවාවල නියුක්ත වූවෝ සාම්ප්‍රදායික සිංහල ජන සමාජයේ අධිපති නොවන කුලවලට අයත් තැනැත්තෝ ය. ඒ මඟින් සමාජ කණ්ඩායම්වල උඩුකුරු සමාජ සචලතාවක් ඇති විය. එය ශ්‍රී ලංකාවේ සමානාත්මවාදී සමාජ සාරධර්ම පෙරමුණු කරගත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් බිහි වීමට අවශ්‍ය කරන පසුබිම කරා මෙහෙයවීමක් විය.

එසේ ධනය උපයාගත් තැනැත්තෝ ඉහළ සමාජ තත්ත්වාභිලාෂයෙන් සමාජ සේවා ආශ්‍රිත කටයුතුවල යෙදෙමින් අධ්‍යාපන, සංස්කෘතික සහ සමාජ තලයේ අභිවර්ධනය සඳහා ක්‍රියා කළහ.

Class Work LK

සමාජයේ පරිවර්තනයක් ලෙස රාජකාරි ක්‍රමය අහෝසි කිරීම, නිදහස් ශ්‍රම වෙළෙඳපොළක් ඇති කිරීම, කණ්ඩායම් වාදය වෙනුවට පුද්ගල වාදය රජයන නෛතික සම්බන්ධතා (වැදගත් මිනුම් දණ්ඩක් ලෙස) ඉදිරියට පැමිණීම, ඉංග්‍රීසි අධ්‍යාපනය යන මේවා සමාජ සංස්කෘතික තලවල සැලකිය යුතු ප්‍රතිසංස්කරණ බිහි වීමට පාදක විය.

මේ වෙනස්කම් මඟින් නව සමාජ පන්ති ක්‍රමයක් නිර්මාණය විය. ලංකාවේ ධනපති සමාජ පන්තියක් බිහි වන්නේ කෝල්බෲක්-කැමරන් යෝජනා කළ ධනේශ්වර ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් වශයෙනි.

ඉංග්‍රීසි අධ්‍යාපනය සහ යටත් විජිත යුගයේ හඳුන්වා දුන් අනෙකුත් සමාජ සංස්කෘතික ප්‍රතිසංස්කරණ සමඟ අතිනත ගෙන තවදුරටත් පැවති වැඩවසම් ක්‍රමය වෙනුවට නූතන සමාජ ක්‍රමයකට පදනම වැටීම සිදුවිය.

එහි ප්‍රතිඵලයක් වශයෙන් එක් අතකින් නූතන සිවිල් සමාජය බිහි වූ අතර යටත් විජිතවාදී ප්‍රතිසංස්කරණවලින් හෝ සෘජු ව ම බටහිර අධ්‍යාපනය වැනි ප්‍රතිසංස්කරණවලින් හෝ ප්‍රතිලාභ නො ලැබූ දේශීය අධ්‍යාපනයට සීමා වූ පන්තියක් ද බිහි විය.

ClassWork.LK

බටහිර සමාජ ක්‍රමය මඟින් ඉල්ලා සිටියෝ බටහිර සමාජ පන්නයට බර වූ එහි දේශපාලන සාරධර්ම අනුගමනය කරන තැනැත්තෝ ය. මෙයට පහසුවෙන් හැඩ ගැසුණෝ ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබූ ප්‍රමාණවත් ධනයක් උපයාගත් කණ්ඩායම් පමණි. දේශීය අධ්‍යාපනය ලැබූ අයට එසේ හැඩ ගැසීමට නොහැකි විය.

ඔවුහු ආචීර්ණ කල්පික රටාවන් අනුගමනය කරමින් නව ආරයක සිවිල් සමාජයක් ගොඩනඟා ගත්හ. එය හැඳින්විය හැක්කේ මූලාකෘතික සිවිල් සමාජය (Prototype of a Civil Society) යනුවෙනි. එහි ලක්ෂණය වන්නේ ප්‍රදේශීයවාදය, ජනවර්ගය, ආගම වැනි දෑ පදනම් කොටගත් සමාජ සංවිධාන බිහි වීම ය.

ClassWork.LK

ClassWork.LK